සැ. යු.- මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2022 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභික නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,302 - 2022 ඔක්තෝබර් මස 14 වැනි සිකුරාදා - 2022.10.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1778 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1782 |


සැ. යු. - (i) විසර්ජන පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) වීමංසා ධම්මගුප්ත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 ඔක්තෝබර් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) ශ්‍රී සීලානන්ද පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2022 ඔක්තෝබර් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 නොවැම්බර් මස 04 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ඔක්තෝබර් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### සිංහල මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු

**පුත්තලම දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.*- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබාගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2022 නොවැම්බර් මස 14** වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 20 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ 3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | ආරච්චිකට්ටුව | උඩප්පුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ උතුරු පිටිගල් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | කල්පිටිය | මාම්පුරිය කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ කල්පිටිය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | කල්පිටිය | නොරොච්චෝලේ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | කරුවලගස්වැව | රාජවන්නිපත්තු උතුරු කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ දෙමළ හත්පත්තුව කොට්ඨාසයේ (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | මාදම්පේ | කරවිටාගාර කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ උතුරු පිටිගල් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |
| පුත්තලම | දංකොටුව | ඕතර පළාත උතුර කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ දකුණු පිටිගල් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම. |

10-132

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු

**පුත්තලම දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම 1'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2022 නොවැම්බර් මස 14 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| පුත්තලම | ආරච්චිකට්ටුව | උතුරු පිටිගල් කෝරළය කොට්ඨාසයේ පුලිච්චාකුලම ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |
| පුත්තලම | හලාවත | උතුරු පිටිගල් කෝරළය කොට්ඨාසයේ හලාවත නගර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |
| පුත්තලම | මූන්දලම | පුත්තලම්පත්තු (පෙරුක්කුවට්ටාන්) කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම |

10-131

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ සිංහල රෙජිස්ට්‍රාර් තනතුරු

**කුරුණෑගල දිස්ත්‍රික්කය**

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 70 වේ).

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. නැතහොත් ඊට සමාන විභාග යකින් සමත් ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම 1'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2022 නොවැම්බර් මස 14 වැනි දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 20 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කුරුණෑගල | ඉබ්බාගමුව | හිරියාල හත්පත්තුව කොට්ඨාසයේ මැල්සිරිපුර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | කුලියාපිටිය නැගෙනහිර | කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ අරක්යාල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | කුලියාපිටිය බටහිර | කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ ඒදණ්ඩේවෙල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | මහව | වන්නි හත්පත්තුව කොට්ඨාසයේ රන්දෙනිගම ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | මාවතගම | වැඋඩවිල්ලි හත්පත්තුව කොට්ඨාසයේ පරගහදෙනිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | රිදීගම | හිරියාල හත්පත්තුව කොට්ඨාසයේ තෙලඹුගල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| කුරුණෑගල | රිදීගම | වැඋඩවිල්ලි හත්පත්තුව කොට්ඨාසයේ පානගමුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

10-130

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### අධ්‍යාපන අමාත්‍යාංශය

2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ගැනීම

01. 2022/2023 අධ්‍යයන වර්ෂය තුළ දී පැවැත්වෙන එක් අවුරුදු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම පාඨමාලාව කොළඹ, පේරාදෙණිය, රජරට සහ යාපනය යන විශ්වවිද්‍යාලවල පැවැත්වේ.

03. (i) එක් එක් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යයන් හා බඳවා ගත හැකි උපරිම අයදුම්කරුවන් සංඛ්‍යාව පහත දක්වා ඇති අතර පාඨමාලාව සඳහා එක් භාෂා මාධ්‍යයකින් පමණක් අයදුම් කළ හැකි ය.

| අනු. අංකය | විශ්වවිද්‍යාලය | මාධ්‍යය | බඳවා ගත හැකි උපරිම අයදුම්කරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | කොළඹ විශ්වවිද්‍යාලය | සිංහල හා දෙමළ | සිංහල - 130<br>දෙමළ - 40 |
| 2 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | සිංහල | සිංහල - 100<br>දෙමළ - නැත |

| *අනු. අංකය* | *විශ්වවිද්‍යාලය* | *මාධ්‍යය* | *බඳවා ගත හැකි උපරිම අයදුම්කරුවන් සංඛ්‍යාව* |
|---|---|---|---|
| 3 | රජරට විශ්ව විද්‍යාලය | සිංහල | සිංහල - 50<br>දෙමළ - නැත |
| 4 | යාපනය විශ්ව විද්‍යාලය | දෙමළ | සිංහල - නැත<br>දෙමළ - 90 |

04 සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු/ඇය පහත සඳහන් සුදුසුකම් ඇත්තෙකු බව තහවුරු කළ යුතු ය. :-

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියෙකු වීම,
(ii) 2022.11.15 දිනට වයස අවුරුදු 50ට නොවැඩි වීම,
(iii) මනා කායික හා මානසික සෞඛ්‍යයකින් සහ යහපත් චරිතයකින් යුක්ත වීම,
(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත වෙනත් ආයතනයකින් උපාධියක් හෝ ඒ හා සමාන මට්ටමෙහිලා සැලකෙන වෙනත් සුදුසුකමක් සපුරා තිබීම.
(v) පහත දැක්වෙන සේවාවලට අදාළ තනතුරක ස්ථිර පත්වීමක් ලැබ සේවය කිරීම.

(*අ*) *ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවය
*ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය
*ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය
*ශ්‍රී ලංකා විදුහල්පති සේවය
*ශ්‍රී ලංකා ගුරු සේවය
*ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවය

(vi) 2022.11.15 වැනි දිනට එකී අංක 04 (v) හි දක්වා ඇති සේවාවකට අයත් තනතුරක උපාධිධාරියකු ලෙස අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සැළකිය යුතු යි* :-

(i) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පත්වීම් ලබා ඇති ගුරුවරුන් 2022.11.15 වැනි දිනට තම පත්වීමට අදාළ බැඳුම්කරයේ කාලසීමාව වන අනිවාර්යය පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණ වී තිබේනම් හා 4 (vi) හි සඳහන් සුදුසුකම් සපුරා තිබේනම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

(ii) අධ්‍යයන නිවාඩු ලබා බැඳුම්කරයකට යටත්ව සිටින අයදුම්කරුවන් 2022.11.15 වැනි දිනට බැඳුම්කරයේ සඳහන් අනිවාර්යය සේවා කාලය අවසන් කළ හෝ එසේ නොමැති නම් ඉන් අවුරුදු පහක්වත් (05) සම්පූර්ණ කර තිබේනම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

(iii) අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළ නොහැකි ය.

05.

05. 1 *තෝරා ගැනීමේ පිළිවෙළ* :

(i) සෑම අයදුම්කරුවෙකු ම ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

(ii) පාඨමාලාව සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණු අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(iii) *ගැසට්* නිවේදනයේ අංක 04 (V) හි අයදුම්කරු අයත්වන සේවාවට/සේවාවලට අදාළ තනතුරෙහි/තනතුරුවල සේවා කාලය සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනැමීම සිදු කෙරෙනු ඇත. සේවා කාලයේ එක් අවුරුද්දකට ලකුණු 04 බැගින් පිරිනැමේ. සේවා කාලය සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය 40 කි. අයදුම්කරුවකුගේ සේවා කාලය ගණනය කරන්නේ ඔහු/ඇය 4(v) හි දැක්වෙන සේවාවන් අතුරින් මුලින් ම පත්වීම ලද සේවයේ අදාළ තනතුරෙහි වැඩභාර ගත් දින සිට ය.

*සැලකිය යුතු යි :*

**4(v) හි සඳහන් සේවාවක/සේවාවල, තනතුරක/ තනතුරුවල අඛණ්ඩ සේවා කාලයක් පැවතිය යුතු ය.**

(iv) ලිඛිත පරීක්‍ෂණයේ ලකුණු හා සේවා කාලය සඳහා ලැබෙන ලකුණුවල එකතුව අවසාන ලකුණ සේ සලකා එම ලකුණු අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා තෝරා ගැනීම සිදු කෙරෙනු ඇත.

(v) දුබලතා සහිත අයදුම්කරුවන් අයදුම් කළහොත් පාඨමාලාවට තෝරාගනු ලබන සංඛ්‍යාවෙන් 1%ක් ඔවුන් සඳහා වෙන් කරනු ලැබේ.

(vi) පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලබන සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලයේ තිබෙන ඉඩකඩ ප්‍රමාණය අනුව තීරණය වනු ඇත.

05.2 ලිඛිත පරීක්ෂණය :

(i) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන් කොළඹ හා යාපනය යන නගරවල දී පැවැත්වේ.

(ii) ඉහත සඳහන් මධ්‍යස්ථාන දෙක අතරින් තමා ඉල්ලුම් කළ මධ්‍යස්ථානයේ දී ඉල්ලුම් කළ මාධ්‍යයෙන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය හැකි ය. අයදුම්කරන ලද විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කරනු නොලැබේ.

(iii) විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම පිළිබඳව ප්‍රකාශ කොට ඇති නීතිරීතිවලට අනුකූලව විභාග අපේක්ෂකයන් විසින් කටයුතු කළ යුතු ය.

(iv) ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත ය.

(*අ*) සාමාන්‍ය දැනීම :
කාලීන තොරතුරු, සාමාන්‍ය දැනීම, අධ්‍යාපනික තොරතුරු හා ගැටලු පිළිබඳ ප්‍රශ්න පත්‍රය
(කාලය පැය 01)

(*ආ*) අභියෝග්‍යතාවය :
භාෂා හැකියාව, අවබෝධය, තර්කනය හා සංඛ්‍යානමය කුසලතා පිළිබඳ ප්‍රශ්න පත්‍රය
(කාලය පැය 01 යි, මිනිත්තු 30 යි)

05.3 සම්මුඛ පරීක්ෂණය :

(i) සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින් විසින් *ගැසට්* නිවේදනයේ 04 වැනි ඡේදය අනුව තමන් පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බව තහවුරු කළ යුතු ය.

(ii) අපේක්ෂකයින් විසින් *ගැසට්* නිවේදනයේ අංක 04 (v) හි සේවාවක/සේවාවල, අදාළ තනතුරෙහි/තනතුරුවල සේවා කාලය තහවුරු කිරීමට නියමිත ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය. විශේෂයෙන් ම මුල් පත්වීමට අදාළ තනතුරෙහි වැඩ භාරගත් දිනය සම්මුඛ පරීක්ෂණයේ දී තහවුරු කළ යුතු ය. එය අපේක්ෂකයාට සේවා කාලය සඳහා නියමිත ලකුණ ලබා ගැනීමට උපකාර වනු ඇත.

(iii) රජයේ ලියාපදිංචි පිරිවෙන් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන ගුරුභවතුන්,

(*අ*) පාඨමාලාව සඳහා නිදහස් කරන බවටත්,
(*ආ*) පාඨමාලාව හදාරන කාලය තුළ වැටුප් ගෙවන බවටත්,
(*ඇ*) පාඨමාලාව අවසානයේ ගුරුභවතා නැවත සේවයට යොදගන්නා බවටත්,
(*ඈ*) අදාළ ගුරුභවතාගේ අධ්‍යයන කාලය තුළ ඔහු/ඇයගේ පුරප්පාඩුවට වෙනත් ගුරුවරයෙකු බඳවා නොගන්නා බවටත්,
(*ඉ*) ගුරුභවතාගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවටත්, ආයතනයේ කාර්‍යාධිකාරි/පාලක මණ්ඩල කළමනාකරු විසින් සහතික කරන ලද ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

(iv) යම් හෙයකින් පාඨමාලාව සඳහා බඳවා ගත හැකි සංඛ්‍යාවට වඩා ඉල්ලුම්පත් ඉදිරිපත්කර ඇති සංඛ්‍යාව අඩුනම්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාවය මත ලිඛිත පරීක්ෂණය පැවැත්වීමෙන් තොරව සම්මුඛ පරීක්ෂණයෙන් පමණක් අයදුම්කරුවන් තෝරාගනු ඇත.

06. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

(i) දී ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපස භාවිතා කරමින් අයදුම්පත් පිළියෙළ කළ යුතු ය.

(ii) දෘශ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන අයදුම්පත්වල වම්පස උඩ කෙළවරේ රතු පාටින් "දෘෂ්‍යාබාධිත/ශ්‍රවණාබාධිත/ වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iii) විභාග ගාස්තු ගෙවීම :
විභාග ගාස්තු වශයෙන් රු. 900 ක මුදලක් ළඟම ඇති තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් කුවිතාන්සිය අයදුම්පතෙහි ඒ සඳහා ඇති කොටුවෙහි ඇලවිය යුතු ය.

**2022.10.14 දින සිට 2022.11.15 දින** දක්වා සියලුම තැපැල් කාර්යාලයන් හි මෙම කුවිතාන්සිය නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදන ලෙස විභාග දෙපාර්තමේන්තුව විසින් තැපැල්පති වෙත දන්වා යවනු ඇත.

(iv) අයදුම්පත් එවීම :

(*අ*) අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව - 2022/2023" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(*ආ*) **2022.11.15 දින** හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවිය යුතු වේ.

(*ඇ*) ඉදිරිපත් කරන අයදුම්පතෙ හි පිටපතක් අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට ආයතන ප්‍රධානියා මගින් භාරදිය යුතු වේ. එය පාඨමාලාව සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහුට/ඇයට අධ්‍යයන නිවාඩු ලබාගැනීමේ දී උපකාරී වනු ඇත.

(v) කාලසටහන් හා ප්‍රවේශපත්‍ර විභාග අපේක්ෂකයින් වෙත තැපැල් මගින් නිකුත් කරන අතර තම ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 07 කට පෙර නොලැබුණහොත් "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට පහත සඳහන් තොරතුරු සහිත ව දැන්විය යුතු වේ.

(*අ*) විභාගයේ නම :————.
(*ආ*) විභාග අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
(*ඇ*) ලිපිනය :————.
(*ඈ*) මුදල් ගෙවන ලද තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :————.
(*ඉ*) ඉල්ලුම්පත තැපැල් කළ දිනය :————.
(*ඊ*) ඉල්ලුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :————.

(vi) කිසිදු හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු භාරදීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම කරනු නොලැබේ.

(vii) අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(viii) සෑම අයදුම්කරුවෙකු ම ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව, වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් මගින් තහවුරු කළ යුතු ය.

(ix) අදාළ පාඨමාලාව හැදෑරීමට අයදුම්කරුවකු යම් විශ්වවිද්‍යාලයකට තෝරාගැනීමෙන් පසු විශ්වවිද්‍යාලය මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

(x) තෝරා ගැනීමෙන් පසුව වුව ද *ගැසට්* නිවේදනයට අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව පෙනී යන්නේ නම් එවැනි අපේක්ෂකයකුගේ තෝරා ගැනීම අවලංගු කිරීමට සිදු වේ.

07. *අධ්‍යයන නිවාඩු :*
තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සහ ජාතික පාසල්, පෞද්ගලික පාසල් සහ පිරිවෙන්වල සේවයේ නියුක්ත විදුහල්පති ශ්‍රේණිධාරීන් සහ ගුරුවරුන් අධ්‍යයන නිවාඩු, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ද සෙසු අයදුම්කරුවන්, අධ්‍යයන නිවාඩු අදාළ පළාතේ අධ්‍යාපන ලේකම් වෙතින් ද අනුමත කර ගත යුතු වේ.

08. *බැඳුම්කරය :*
පාඨමාලාවට තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නීති රීති අනුව නියමිත කාල පරිච්ඡේදයක් ඔහු/ඇය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට අධ්‍යාපන ලේකම්/පළාත් අධ්‍යාපන ලේකම් සමග ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතු වේ.

09. තෝරාගනු ලැබූ අයදුම්කරුවකු පාලනය කර ගත හැකි හේතූන් මත පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ නොකර නියමිත කාලසීමාව ඇතුළත දී ඩිප්ලෝමා සහතිකය ලබාගැනීමට අපොහොසත් වූයේ නම්, එම අධ්‍යයන නිවාඩු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද සම්පූර්ණ වැටුප් හා දීමනා ආපසු ගෙවිය යුතු වේ.

10. පාඨමාලාව හදාරන කාලය තුළ දී ශිෂ්‍යයින්ගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක බව පෙනී ගියහොත් ඔවුන් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

11. මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

එම්. එන්. රණසිංහ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2022 සැප්තැම්බර් මස 28 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

***2022/2023 වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කිරීම***

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| *ඉල්ලුම් කරන මාධ්‍යය (සිංහල/දෙමළ)* | *ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය (කොළඹ/යාපනය)* | *ඉල්ලුම් කරන විශ්වවිද්‍යාල (කොළඹ/පේරාදෙණිය/රජරට/යාපනය) සැ. යු. :* මනාපය අනුපිළිවෙළින් විශ්වවිද්‍යාල දෙක සඳහන් කරන්න. |
|---|---|---|
| | | 1.<br>2. |

01. (i) මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (වාසගම ඉදිරියෙන්) :————.
*උදා* : Mr. SILVA A.B.C.

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | |

03. (i) (අ) රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) රාජකාරි දුරකථන අංකය :————.

(ii) (අ) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) පෞද්ගලික දුරකථන අංකය :————.

(iii) සේවය කරන පාසලේ/ ආයතනයේ පිහිටීම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ඃ

| පළාත | දිස්ත්‍රික්කය | කලාපය |
|---|---|---|
| | | |

(iv) ආයතනයේ ස්වභාවය (රජයේ පාසල්/පෞද්ගලික පාසල්/පිරිවෙන්/වෙනත්) :————.

04. (i) උපන් දිනය ඃ අවුරුද්ද :————, මාසය :————, දිනය :————.
(ii) 2022.11.15 වැනි දිනට වයස ඃ අවුරුදු :————, මාස :————, දින :————.
(iii) ස්ත්‍රී/පුරුෂ භාවය :————.

05. උපාධිය පිළිබඳ විස්තර ඃ

| උපාධිය | විශ්ව විද්‍යාලයේ පාඨමාලාව හැදෑරූ කාලය (…… සිට ……. දක්වා) | උපාධිය සමත් වූ වර්ෂය | උපාධිය වලංගු දිනය | උපාධි විෂයයන් | සාමාර්ථයේ ස්වභාවය | විශ්ව විද්‍යාලය/ ආයතනය | උපාධිය (අභ්‍යන්තර /බාහිර) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

06. (i) (අ) ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවයට/ශ්‍රී ලංකා පරිවේණාචාර්ය සේවයට/ ශ්‍රී ලංකා ගුරු සේවයට පත්වූ දිනය :————.
(ආ) එම සේවයේ වැඩ භාරගත් දිනය :————.
(ඇ) දැනට දරන තනතුර :————.

(ii) (අ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට/ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට/ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ දිනය :————.
(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ/ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වැඩ භාරගත් දිනය :————.

(iii) උපාධියෙන් පසු 2022.11.15 වැනි දිනට 4(v) හි සඳහන් අදාළ සේවයේ/ සේවාවල සේවා කාලය :————.

(iv) 2022.11.15 වැනි දිනට 4(v) හි සඳහන් අදාළ සේවයේ/සේවාවල සම්පූර්ණ සේවා කාලය :————.

07. වෘත්තීය පුහුණුව පිළිබඳ විස්තර :

| පාඨමාලාව හැදෑරූ ආයතනය (ගුරු විද්‍යාලය/ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හෝ වෙනත්) | පාඨමාලාව (විෂය ක්ෂේත්‍රය) | ආයතනයේ පාඨමාලාව හැදෑරූ කාලසීමාව | |
|---|---|---|---|
| | | දින සිට | දින දක්වා |
| | | | |

08. ලබාගත් අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර :

| අධ්‍යයන නිවාඩුවේ ස්වභාවය (වැටුප් සහිත/ වැටුප් රහිත, දේශීය/විදේශීය) | අධ්‍යයන නිවාඩු ලබාගත් කාරණය | කවර කාලසීමාවේද යන්න | බැඳුම්කර කාලය (….. දින සිට ……. දින දක්වා) | බැඳුම්කර කාලය සම්පූර්ණ කර ඇති ද/නැති ද යන වග (සම්පූර්ණ නැතිනම් ඒ සඳහා ඉදිරියට ඇති කාලය සඳහන් කරන්න) |
|---|---|---|---|---|
| | | | | |

***සැලකිය යුතු ය*** :-

මීට පෙර ලබා ඇති අධ්‍යයන නිවාඩුවලට අදාළව උක්ත වගුව නිවැරදිව සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

***සටහන*** : ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ කාලසීමාව අධ්‍යයන නිවාඩුවක් ලෙස නොසැළකේ.

09. (*අ*) ඔබට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පවතී ද? ඔව්/නැත

(*ආ*) පවතී නම් ඒ සම්බන්ධ තොරතුරු :————.

10.

| | |
|---|---|
| තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවන්න. | කුවිතාන්සි අංකය :————.<br>දිනය :————.<br>තැපැල්/උප තැපැල් කාර්යාලයට රු. :———.<br>(මුදල අකුරෙන්) ගෙවන ලද බවට සහතික කරමි.<br>අයදුම්කරුගේ අත්සන :————.<br>දිනය :————. |

11. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම ඉල්ලුම් පත්‍රයේ දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි හා සත්‍ය බවට ද 2022.10.14 වැනි දින *ගැසට්* නිවේදනයේ 04 වැනි ඡේදය අනුව මා මෙම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බවට ද, විභාග පනතේ අයදුම්කරුවන් සඳහා වූ නීතිරීති

වලට එකඟව කටයුතු කරන බවට ද, නියමිත විභාග ගාස්තු ගෙවා වලංගු කුවිතාන්සියක් අමුණා ඇති බවට ද මෙයින් සහතික වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12. පාඨමාලාව සඳහා ආයතනයෙන් නිදහස් කිරීමේ නිර්දේශය :
(විදුහල්පති, පීඨාධිපති, කෘත්‍යාධිකාරී, පාලක මණ්ඩලයේ කළමනාකරු හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.)

පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමේ අවශ්‍යතාවය සලකා බලා මෙම අයදුම්කරු සේවයෙන් නිදහස් කරමි/නොකරමි.

————.
විදුහල්පතිගේ/ ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

13. පාඨමාලාව සඳහා අයදුම්කරු නිදහස් කිරීම පිළිබඳ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය :

උක්ත නම් සඳහන් අයදුම්කරු පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.
(අත්සන හා නිල මුද්‍රාව)

දිනය :————.

10-113

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.